
# අපූරු අඹ ගස



රෂිනි රදීමහලියද්ද

# අපූරු අඹ ගස

රජිනී රදීමහලියද්ද

අපූරු අඹ ගස

© රිෂිනි රිදීමහලියද්ද
මහාමායා බාලිකා විදුහල
4 ශ්‍රේණිය D
2025.02.08

ISBN 978 - 624 - 208 - 284 -4

## පිදුම

*මා හට අකුරු කියාදී යහමග පෙන්වූ*

*ගුරු මෑණිවරුන්ට සහ ගුරු පියවරුන්ට*

*ආදරයෙන් පුදමි.*

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර.

එකමත් එක ගමක කන්දක් මුදුනේ අඹ ගසක් තිබුනා. ඉතින් මේ ගමට සමහර කාල වලදී වැස්ස එනවා. මහ සුළං එනවා, වැස්ස නැති කාලයක් එනවා. මේ හැම කරදරයක්ම දරා ගෙන අඹ ගස හොඳින් හැදුණා.

මේ අඹ ගහ හරිම විශාලයි. හැම පැත්තටම අතු බෙදිලා තිබුණා. පළතුරු හැදෙන කාලයට අඹ ගස ගෙඩි වලින් පිරිලා තිබුණා. අඹ ගෙඩි වල බරට අතු බිමට පාත් වෙනවා. ඉතින් මේ කාලෙට කුරුල්ලෝ,රිලවු,ලේන්නු, පුංචි සත්තු වගේම ළමයිනුත් රසම රස අඹ ගෙඩි කාලා බඩ පුරවා ගත්තා.



මේ ගමේ ගොඩක් දුප්පත් පවුලක ලීසා කියලා ළමයෙක් ජීවත් වුණා. මේ ළමයා හැමදාම අඹ ගස ළඟට එනවා.ගෙඩි තියෙන දවස් වලට වගේම ගෙඩි නැති දවස්වලටත් ලීසා අඹ ගස බලන්න ආවා. ලීසා අඹ ගස උඩ නැගලා අඹ කඩන් කනවා. අඹ ගස වටේ දුවලා සෙල්ලම් කරා. අඹ අතු වල එල්ලිලා ඔංචිලි පැද්දා. සමහර වෙලාවට අඹ ගසේ අතු කැඩුණා. අඹ ගසට ගොඩක් රිදුණා. ඒත් අඹ ගස කවදාවත් ලීසා එක්ක තරහ වුණේ නෑ.



සෙල්ලම් කරලා මහන්සි වුණාම ලීසා අඹ ගසේ සෙවණ යට හොඳට නිදා ගන්නවා. අඹ ගස ලීසාට හරිම ආදරෙයි. අඹ ගස හරිම කැමතියි ලීසා එයාගේ ගෙඩි කාලා බඩ පුරවා ගන්නවාට. එයා වෙලාවට අඹ ගස බදාගෙන කතා කරනවා. ලීසාට කන්න අඹ ගස අඹ ගෙඩි ගොඩක් හදා ගන්නවා.



මෙහෙම කාලයක් හෙමින් හෙමින් ගෙවිලා ගියා. හැමදාම අඹ ගස බලාගන්න එන්න ලීසා එදා ආවේ නෑ. අඹ ගස හරිම දුකෙන් මඟ බලාගෙන හිටියා. දවසින් දවස කාලය ගෙවිලා ගියා ලීසා අඹ ගස බලන්න ආවේ නෑ. අඹ ගසට හරිම පාලුයි වගේම හරිම දුකයි. අඹ ගසත් දවසින් දවස වයසට ගියා. ඉස්සර වගේ නෙවෙයි ගසේ කොළ හැලෙන්න ගත්තා.



දවසක් ලීසා අඹ ගස ළඟට ආවා. එයා දැන් ලොකු ළමයෙක්. එයා හරිම ලස්සන වෙලා. අඹ ගසට හරිම සතුටුයි. අඹ ගස ලීසාට කතා කළා සෙල්ලම් කරන්න. ඒත් ලීසා කිව්වා මම දැන් ලොකු ළමයෙක්. මට දැන් ඉස්සර වගේ සෙල්ලම් කරන්න බෑ. ගහ වටේ දුවලා. මම ආසයි බයිසිකලයක් පදින්න.ඒත් මට බයිසිකලයක් ගන්න සල්ලි නෑනේ.
ලීසා හරිම දුකෙන් එහෙම කිව්වා.



අඹ ගසටත් හරිම දුකයි. අඹ ගස කීවා මගේ ළඟ සල්ලි නම් නෑ.හැබැයි ඔයාට පුළුවන් මගේ අඹ ගෙඩි ඔක්කොම කඩාගෙන ගිහින් ඒවා විකුණන්න.ඒ ලැබෙන සල්ලි වලින් බයිසිකලයක් ගන්න.ඉතින් ලීසාට හරිම සතුටුයි.ලීසා අඹ ගසට නැගලා අඹ ගෙඩි ඔක්කෝම කඩාගෙන අඹ ගසට ස්තූති වෙලා යන්න ගියා. අඹ ගසට හරිම සතුටුයි.



ආයෙත් දවසක් ලීසා අඹ ගස ළඟට එනවා.අඹ ගස හරිම සතුටුයි. ඒ වගේම පුදුමයි.

"ලීසා මාත් එක්ක එන්න සෙල්ලම් කරන්න එන්න "අඹ ගස ලීසාට කිව්වා.

"මට සෙල්ලම් කරන්න වේලාවක් නෑ.මට ගෙයක් හදා ගන්න ඕනි. ඔයාට පුලුවන්ද මට උදව් කරන්න " ලීසා ඇහුවා.

අඹ ගස ටිකක් කල්පනා කරා "මට කරන්න පුලුවන් එක උදවුවක් විතරයි. මගේ අතුටික කපාගෙන ගිහින් ගෙයක් හදා ගන්න " අඹ ගස කිව්වා. ලීසාට හරිම සතුටුයි. අඹ ගසේ අතු ටික කපාගෙන ලීසා යන්න ගියා.



ගොඩක් කාලයකට පස්සේ ලීසා ආයෙමත් අඹ ගස ළඟට ආවා . අඹ ගසට හරිම සතුටුයි. ලීසා අඹ ගසට කියනවා.

යාළුවේ මගේ තරුණ කාලය අවසන් වී ගෙන එන්නේ. මට දැන් විවේකීව ඉන්න ඕනි. මම ආසයි බෝට්ටුවකින් සවාරියක් යන්න.ඒත් මට බෝට්ටුවක් නෑනේ.

මට ඔයාට උදව් කරන්න පුළුවන් ලීසා.ඔයා මගේ කඳ කපාගෙන ගිහින් ඒකෙන් බෝට්ටුවක් හදා ගන්න. අඹ ගස කිව්වා.

ලීසාට හරිම සතුටින් අඹ ගසේ කඳ කපාගෙන යන්න ගියා. ඊට පස්සේ ලීසා ඒකෙන් බෝට්ටුවක් හදාගෙන මුහුදෙන් සංචාරයක් ගියා.



ලීසා හරිම සතුටින් අඹ ගසේ කඳ කපාගෙන යන්න ගියා.ඊට පස්සේ ලීසා ඒකෙන් බෝට්ටුවක් හදාගෙන මුහුදෙන් සංචාරයක් ගියා.



අඹ ගසට ආයේ ගෝඩක් කාලයකට පස්සේ ලීසාව දක්කනට ලැබුණේ නැ.ගොඩක් කාලයකට පස්සේ ලීසා ආවේ ගස හොයාගෙන ආවා. ඒත් අඹ ගස තිබුණේ නෑ. එතන තිබුණේ ඉතිරි කොට කෑල්ලක් පමණයි. ලීසාව දැකලා අඹ ගස සතුටු වුණා.

ඔයාට දෙන්න මන් ළඟ මොනවත් නෑ. මගේ ලඟ තියෙන්නේ මේ මුල් කොටස විතරයි. අඹ ගස කිව්වා.



මට දැන් මොනවත් ඕනි නෑ.මට දැන් හරි මහන්සියි. මට ඕනි විවේකයෙන් ඉන්න.

ලීසාට දෙන්න මං ළඟ අඹ ගෙඩියක්වත් නෑ

මට අඹ කන්න දත් නෑ. මට මට අඹ එපා ලීසා දුකින් කිව්වා.

එහෙම නම් මගේ මුගේ ඉඳගන්න. හොදින් විවේක ගන්න. අඹ ගස කිව්වා. ඒ දෙන්නා හරිම සතුටින් එයාලගේ තොරතුරු හුවමාරු කරගත්තා. දෙන්නට හරිම සතුටුයි.



අඹ ගස හරි හොඳ යාළුවෙක්. එයාට කිසිම දෙයක් ඉතිරි කර ගන්නේ නැතුව හැමදෙයක්ම තමන්ගේ යාළුවාට සතුට වෙනුවෙන් දුන්නා.

ලීසාත් තමන්ට උදව් උපයෝගී කළ යාළුවාව අමතක නොකර එයාව බලන්න ආවා.

අපිත් මේ වගේ හොඳ යාළුවෝ වෙමු.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.

මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්විම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්